# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION

ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය


2021.04.10

ගරු රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මැතිතුමා
සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය
ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
දෙවන අධියර
සෙත්සිරිපාය
බත්තරමුල්ල

## සමෘද්ධි බැංකු මගින් රු 5000.00 දීමනාව ගෙවීම සම්බන්ධවයි.

උක්ත කරුණ සම්බන්ධයෙන් සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය විසින් 2021.04.10 දින නිකුත් කරණ ලද රු 5000 ක දීමනාව ගෙවීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති ලිපිය සම්බන්ධවයි.

එම ලිපියට අනුව සමෘද්ධි ලාභීන් හා අඩුආදායම් ලාභීන් සඳහා රු 5000.00 ක දීමනාවක් ලබාදීමට යෝජනා කර ඇත.එම යෝජනාව ඉතාමත් සුදුසු යෝජනාවක් බව ප්‍රකාශ කරමි.නමුත් මෙම දීමනාව ගෙවීම සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදය හා කාලවකවානුව පිලිබඳව අප සංගමය එකග නොවන බව කණගාටුවෙන් යුතුව මෙයින් දන්වා සිටිමි.

එයට හේතුව වනුයේ
පළමු හා දෙවන කොවිඩ් රැල්ල හමුවේ ආර්ථිකමය වශයෙන් අසරණවූ සමෘද්ධි ලාභීන් හා අඩුආදායම් ලාභීන් සඳහා රු 5000.00 ක දීමනාවක් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සමෘද්ධි බැංකුසතු අරමුදල් භාවිතා කරමින් ගෙවීම් සිදිකළ අතර මේ දක්වා එම මුදල් සමෘද්ධි බැංකු වෙත ප්‍රතිපූරණය කර නොමැතිවීම.

මෙම හේතුව නිසාවෙන්ම සමෘද්ධි බැංකු පද්ධතිය අළාභ ලබන තත්වයට පත්වන බවත් සාමාජිකයන් සතු ඉතිරිකිරීම් වලට දැඩි බලපෑමක් එල්ල කරණ බවත් ඒ තුලින් සමෘද්ධි බැංකු විනාශය කරා ඇදීයන බවත් මෙසේ සිදුවන්නේ අනවශ්‍ය දේශපාලන තීන්දු නිසා බවද කණගාටුවෙන් යුතුව පෙන්වා දෙමි.

එසේම මෙවැනි තීරණයක් ගන්නේනම් ක්‍රියාත්මක කිරීමට සුදුසු කාලසීමාවක් ඉදිරියට තිබෙන ආකාරයටත් වෘත්තීය සමිතිද කැදවා සාකච්ඡා කොට තීරණ ගණු ලබන්නේනම් ඔබට මෙන්ම අපටද මෙවැනි ගැටලු සහගත තත්වයන් ඇති නොවන බවද මෙයින් පෙන්වා දෙමි.

මේ වන විට රටේ සමස්ථ ජන ජීවිතය සාමාන්‍ය පරිදි සිදුවෙමින් පවතින අතර සමෘද්ධි ලාභීන් හා අඩුආදායම් ලාභීන් ගෙන් මෙවැනි ඉල්ලීමක් ඉදිරිපත් නොවූ මොහොතක මහ ජනතාව තුල බලාපොරොත්තු ඇතිකරමින් ඔවුන් හා අප


සභාපති
එන්.ජේ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ජේ.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය
2021.04.10

නිළධාරීන් අතර අර්බුද ඇතිවන ආකාරයේ ප්‍රකාශ නිකුත් කරමින් අප නිළධාරීන් දැඩි අපහසුතාවයට පත්කෙරෙන මෙවැනි තීරණ ගැනීම සම්බන්ධයෙන් අප සංගමයේ කණගාටුව හා දැඩි විරෝධතාවයද මෙයින් ප්‍රකාශකර සිටිමි.

කෙසේ නමුත් මේවන විට මෙම රු 5000.00 ක දීමනාව ගෙවීම සම්බන්ධයෙන් රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙනඇති බව අප සංගමයට පෙනීයන බැවින් රජය අපහසුතාවයට පත්නොකර පහත සදහන් ආකාරයට කටයුතු කිරීමට සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමන්ට හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමන්ට අප සංගමයේ ගරු සභාපති අබේසිංහ මහතා දුරකථනයෙන් දැනුම්දුන් පරිදි පහත සදහන් ආකාරයට කටයුතු කිරීමට එකගවන බවද මෙයින් ප්‍රකාශකර සිටිමි.

01.ගෙවියුතු සමස්ථ මුදල් ප්‍රමාණය බැංකු සංගම්වලට ලැබීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු කිරීම.

02.මෙම කාලවකවානුව තුල අප නිළධාරීන් ඉහත කණ්ඩායමට අවශ්‍ය තරම් මුදල් ගෙවීම් සිදුකරමින් හා සමෘද්ධි පොලවල් සංවිධානය කර පවත්වමින් දැඩි වෙහෙසකර තත්වයකට පත්ව ඇති බැවින් හා ඔවුන්ගේ පවුල් ඒකක තුලද අවුරුදු චාරිත්‍ර ඉටුකිරීමට අවස්ථාව ලබාදීම සදහාත් අප්‍රේල් මස 15 දිනෙන් පසුව සාමාන්‍ය ආකාරයට මෙම රු 5000.00 දීමනාව ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

03.සමෘද්ධි බැංකුවල අවශ්‍ය මුදල් ප්‍රමාණයන් පවතින්නේ නම් හා එම බැංකුවල කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල් තුමන්ගේ ලිපියට අනුව කටයුතු කිරීමට කැමැත්තක් දක්වන්නේනම් ඔවුන් කිසිවෙකුට බාධා නොකිරීමටත් පූර්ණ සහයෝගය සංගමයක් ලෙස ලබා දීමටත් කටයුතු කරණ බවද ප්‍රකාශ කරමි.

ඒසේම කිසිදු නිළධාරියකුගේ බලපෑම්මත තම රාජකාරී කටයුතු සිදුකිරීම් නොකරණ ලෙසටත් මෙම ක්‍රියාව සාර්තකව සිදුවන්නේ 2021.04.15 දිනෙන් පසුව බැවින් අප නිළධාරීන්ට විරුද්ධව කටයුතු නොකරන ලෙසත් එසේ සිදුකළහොත් එයට විරුද්ධව වෘත්තීය ක්‍රියාමාර්ග වලට එළඹෙන බවද කණගාටුවෙන් වුවද මෙයින් දන්වා සිටිමි.

තවද අප නිළධරීන්ට සෘජුවම බලපාන්නාවූ ගැටලු ගනනාවක් අවුරුදු 07 පුරාවට නොවිසදී ඇති බැවින් එය විසදා ගැනීමට ඉදිරිපත් කරණු ලබන සමස්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අනුමත නොකරමින් අප නිළධාරීන් දේශපාලන කටයුතු වලට පමණක් යොදාගැනීම අප පිහිටුවාගත් ආණ්ඩුවද කටයුතු කිරීම නවතා දැමීමට කාලය එළඹ ඇතිබවද මෙයින් දන්වා සිටිමි.සමස්ත රජයේ සේවකයන් සදහා විශේෂ නිවාඩු දිනයන් ලබාදෙමින් එක් රාජ්‍ය සේවක කොටසකට දැඩි අසාධාරණයක් මේ තුලින් සිදුවන බවද මෙයින් අවධාරණය කර සිටිමි.


සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051